# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1947/12 – 2015 දෙසැම්බර් 29 වැනි අඟහරුවාදා – 2015.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/38/2012.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2015 ජූලි මස 02 වැනි දින අංක 1921/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2015 ජූනි මස 24 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී. එච්. ධර්මසේන මයා, “හේවා වාස”, මහගම, (කළුතර හරහා)
02. ඩබ්. ඒ. වික්‍රමසිංහ මයා, නො. 56, තල්වත්ත, ගෝනවල (බ.ප.)
03. පී. එම්. ජී. බී. සේනානායක මයා, නාපාන, ගුන්නෑපාන
04. ඒ. ඩබ්. ඩබ්. අබේසිරිවර්ධන මිය, “අතාවුද ගාඩ්න්ස්”, ගඩලාදෙනිය පාර, පිලිමතලාව

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

අතර පවත්නා 2015 ජූනි මස 18 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. ඊ. සාන්තරාජන් මහතා වෙත යොමු කරන ලදී.

1A – G22778 – 27 (2015/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2015 ජුනි මස 24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

01 - 497/1

---

මගේ අංකය: IR/10/38/2012.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී. එච්. ධර්මසේන මයා, “හේවා වාස”, මහගම, (කළුතර හරහා)
02. ඩබ්. ඒ. වික්‍රමසිංහ මයා, නො. 56, තල්වත්ත, ගෝනවල (බ.ප.)
03. පී. එම්. ජී. බී. සේනානායක මයා, නාපාන, ගුන්නෑපාන.
04. ඒ. ඩබ්. ඩබ්. අබේසිරිවර්ධන මිය, “අතාවුද ගාඩින්ස්”, ගඩලාදෙනිය පාර, පිළිමතලාව

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 06, ඩබ්. ඒ. සිල්වා මාවත, ඒ. පී. ටී. 503, නො. 181/1, ටී. ඊ. සාන්තරාජන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/38/2012.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී. එච්. ධර්මසේන මයා, “හේවා වාස”, මහගම, (කළුතර හරහා)
02. ඩබ්. ඒ. වික්‍රමසිංහ මයා, නො. 56, තල්වත්ත, ගෝනවල (බ.ප.)
03. පී. එම්. ජී. බී. සේනානායක මයා, නාපාන, ගුන්නෑපාන
04. ඒ. ඩබ්. ඩබ්. අබේසිරිවර්ධන මිය, “අතාවුද ගාඩින්ස්”, ගඩලාදෙනිය පාර, පිළිමතලාව

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

1988.01.01 දින වන විට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ IV වන ශ්‍රේණියේ නිලධාරීන් ලෙස සේවය කර ඇති, පහත නම් සඳහන් සේවකයින් 04 දෙනා විසින් 1988.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි III ශ්‍රේණියේ III පන්තිය ලබා ගැනීමටත්, ඒ හා සමගාමී ශ්‍රේණියන්හි පිහිටුවීමටත්, ඉන් අනතුරුව ලැබිය යුතු ඉදිරි තනතුරු හා ශ්‍රේණි ලබා ගැනීම වෙනුවෙනුත් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගතද? එසේ යුක්ති සහගත වන්නේ නම් ඔවුනට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න වේ.

01. ටී. එච්. ධර්මසේන මයා
02. ඩබ්. ඒ. වික්‍රමසිංහ මයා
03. පී. එම්. ජී. බී. සේනානායක මයා
04. ඒ. ඩබ්. ඩබ්. අබේසිරිවර්ධන මිය

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

01 - 497/ 2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.